# දකුණු ආසියාවේ දේශපාලනයට භූ දේශපාලනය සිදුකරන බලපෑම

**කේ.එම්.ඩී.චමිලා ප්‍රසාදි**
සහකාර කථිකාචාරිනී, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය
prasahas@gmail.com

---

නූතනත්වයේ ව්‍යාප්තිය දක්වා ඉතිහාසයක් ඇති සංකල්පයක් ලෙස භූ දේශපාලනය හඳුනා ගත හැකි අතර එය ''භූමිය මත මිනිසාගේ බලය හා පාලනය පිළිබඳ සජීවී ක්‍රියාකාරීත්වය කාලීනව හා අවකාශීයව අධ්‍යයනය කරනු ලබන ක්‍රියාවලියකි.''මෙහිදී වඩාත් සැලකිලිමත් වන්නේ මිනිසාගේ දේශපාලනචර්යා පිළිබඳවයි. දේශපාලනචර්යා ස්ථිර මෙන්ම ගතික ස්වභාවයක් ද ගනු ලබයි. වැඩි අවධානයක් යොමු කිරීමේදී භෞතික සාධක සමඟ දේශපාලනය වෙනස්වන ආකාරය භූ දේශපාලනයේදී අධ්‍යයනය කරනු ලබයි. මේ පිළිබඳ සිය අදහස් දැක්වූවන් අතර Rudolf Kjellen වඩාත් වැදගත් අයෙකි. ඔහුට අනුව භූ දේශපාලනය යනු ''භූගෝලීය සාධක මත පදනම් වෙමින් විදේශ සම්බන්ධතා හා ප්‍රතිපත්ති තීරණය කිරීමයි.'' (http://prd.org/countries/Indiaospx)

එමෙන්ම විලියම් පෙටී විසින් රචිත Essay in Political Arithmatic නැමැති කෘතිය තුළ රාජ්‍යත්වය කෙරෙහි තිබෙන්නාවූ භූගෝලීය පදනම පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. භූගෝලීයව තිබෙන පරිසර ක්‍රියාවලීන් පාලනයට බලපාන බව ඔහු තව දුරටත් ප්‍රකාශ කරයි.

Sir Halford Mackinder විසින් 1904 වර්ෂයේදී The Geographical Pivot of History නැමති ලේඛනය තුළින් ''හදබිම් සංකල්පය'' (Heartland theory) හඳුන්වා දෙනු ලැබීය. එහිදී ඔහු විසින් Word Island හා Peripheral Islands ලෙස ලෝකය කොටස් 2කට බෙදා වෙන් කරනු ලබන අතර එහිදී ස්වාභාවික සම්පත් අත්පත් කර ගැනීම මත Peripheral Island වැඩි වාසිදායක තත්ත්වයන් අත්පත් කරගන්නා බව ඔහු පෙන්වා දෙයි.''(ශාන්ත කේ. හෙන්නායක, පිටුව 28)

මෙසේ භූ දේශපාලනය යනු කුමක්ද යන්න හඳුනාගනු ලැබූවද භූ දේශපාලන සාධක පිළිබඳවත් අවධානය යොමු කළ යුතු වේ. මෙහිදී රටක් යනු සංවිධානාත්මක පද්ධතියකි. රටක පැවතීමට දේශපාලන සාධක තිබිය යුතුය. රටක පැවැත්ම උදෙසා මෙම සාධක ක්‍රියාත්මක වන ආකාරය මෙහිදී සාකච්ඡා කරයි. ඒ අනුව භූ දේශපාලන සාධක ප්‍රධාන ලෙස කොටස් දෙකකට බෙදා දැක්විය හැක. එනම්,

| භෞතික සාධක | මානව සාධක |
|---|---|
| පිහිටීම, දූපත්,<br><br>මහද්වීපය, අර්ධද්වීපය,<br><br>අවට තිබෙන දේශපාලනය, අභ්‍යන්තර රාජ්‍යන් , විවෘත රාජ්‍යන් | ආර්ථික ශක්තිය,<br><br>දේශපාලන ස්ථාවර බව,<br><br>කාන්තා ශක්තිය, නායකත්වය,<br><br>අධ්‍යාපන මට්ටම, සංස්කෘතිය |

මෙපරිද්දෙන් භූ දේශපාලනය යන්න හඳුනා ගනු ලැබුවද එය දකුණු ආසියානු දේශපාලනයට සිදු කරනු ලබන බලපෑම කෙසේද යන්න විමසා බැලිය යුතුවේ. මෙහිදී දකුණු ආසියානු භූගෝලීය ප්‍රදේශයේ පසුබිම වෙත අවධානය යොමු කිරීමේදී, දකුණු ආසියාව යනු ඉන්දියාව පදනම් කරගත් ඉන්දියානු උපමහද්වීප රටවල් 07 ක් එක් වී නිර්මාණය වූ කලාපයකි. එය බටහිර, මධ්‍යම, නැගෙනහිර හා දකුණු නැගෙනහිර ආසියාවෙන් සමන්විත වූ කලාපයකි. මෙම කලාපය භූගෝලීය දේශසීමා අටකින් නිර්මාණය වීඇත.එනම් ඉන්දියාව, ශ්‍රී ලංකාව, පකිස්ථානය,නේපාලය,භූතානය,මාලදිවයින,බංගලාදේශය සහ ඇෆ්ගනිස්ථානයයි. මෙම රටවල ලොව විශාලතම ජනගහනයක් වාසය කරන අතර එය ලෝක ජනගහනයෙන් 1/5 කි.මෙසේ රාජ්‍යයන් අටකින් නිර්මාණය වූ දකුණු ආසියානු කලාපය තුළ දේශපාලනයට භූ දේශපාලනය සිදු කරන්නා වූ බලපෑමේ ස්වභාවය පිළිබඳව අවධානය යොමුකිරීමේදී ඉන්දියාවට වැදගත් ස්ථානයක් හිමිවේ.

**ඉන්දියාව**

දකුණු ආසියානු කලාපයේ බලවත්ම රාජ්‍යය හෙවත් විශාලතම රාජ්‍ය වූ ඉන්දියාව වර්ග කිලෝමීටර 7000 ඉන්දියන් සාගරයෙන්ද, බටහිරින් අරාබි මුහුදින් ද, නැගෙනහිරින් බෙංගාල බොක්කෙන්ද ඉන්දියනු අර්ධද්වීපයසැදුම් ගනී. 1947 අගෝස්තු 15 වන දින ඉන්දියාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගෙන් නිදහස ලබා ගත්තද එකී නිදහස බොහෝ අර්බුද ගණනාවක සමාරම්භය යැයි ඔවුන් නොසිතන්නට ඇත. මෙහිදී බ්‍රිතාන්‍යයෙන් ඉන්දියාවට නිදහස ලබාදීමේදී ඉන්දියාව, බටහිර හා නැගෙනහිර පාකිස්ථානය ලෙස රාජ්‍යයන් 3කට බෙදා වෙන් කරනු ලැබීය. මෙලෙස ඉන්දීය භූමිය බෙදාවෙන් කිරීමේ ප්‍රතිපත්තිය මත ඉන්දියාව බොහෝ අර්බුද ගණනාවකට පත්ව ඇත. සිය භූමිය පකිස්ථානය අතර බෙදී යන්නේ කාශ්මීර ප්‍රදේශයේ පවතින දේශසීමාව පදනම් කර ගනිමිනි. මෙම ප්‍රදේශය ආශ්‍රිතව පවත්නා භූ දේශපාලනමය වැදගත්කම දෙරටෙහිම බලය පවත්වා ගැනීමට ඉවහල් වන්නකි. මෙකී තත්ත්වය මත කාශ්මීරයට අයිතිය ඉල්ලා ඉන්දියාවත් පාකිස්ථානයත් ගැටුම් ඇති කර ගැනීම මත එය විශාල ජීවිත හානියක් මෙන්ම දේපල හානියක්ද සිදු කරනු ලැබුවා වූ ව්‍යාවසනකාරී තත්ත්වයකි. මෙය හේතු කොටගෙන හින්දු සහ මුස්ලිම් ජාතිවාදී ගැටුම්ද නිර්මාණය වීම තුළ හින්දු මුස්ලිම් ලෙස ජාතීන් ලෙසත්, ආගම්වාදීන් ලෙසත් දෙකඩ විය. මෙයට බලපාන ලද ප්‍රධානතම භූ දේශපාලන සාධකය වූයේ භූමියයි. භූමිය මත ජාතිවාදීත්වය හා ආගම්වාදීත්වය ගොඩනැගුනි. එමෙන්ම නාගලන්තය, මිසෝරාම්, ත්‍රිපුර හා

ඇසෑම් යන ප්‍රාන්ත රාජ්‍යයන්ද වෙනම රාජ්‍යයන් ලෙස බෙදී යාමට උත්සාහ කරනු ලැබීය. ඔවුන්ට අවශ්‍ය වී ඇත්තේ වෙනම රාජ්‍යයන් ගොඩනගා ගැනීමයි. බහු වාර්ගික, බහු භාෂා, බහු ආගම් සමුප්‍රදායෙන් මිදී ඒකීය රටක් ලෙස කටයුතු කිරීමටය. තව දුරටත් අවධානය යොමු කිරීමේදී භූමිය මත පදනම් වෙමින් වෙනම රාජ්‍යය සංකල්පය උදෙසා ක්‍රියාකල බෝඩෝලන්ත ව්‍යාපාරයත්, ගෝර්කාලන්ත ව්‍යාපාරයත් පෙන්වාදිය හැක.

**පකිස්ථානය**

පකිස්ථානය වෙත අවධානය යොමු කිරීමේදී එය ''පකිස්ථාන ඉස්ලාම් සමූහාණ්ඩුව'' ලෙස හඳුන්වනු ලබන අතර දකුණින් අරාබි මුහුදින්ද ඇෆ්ගනිස්ථානය හා ඉරාන දේශසීමාවලින් හා නැගෙනහිරින් ඉන්දියාවෙන්ද උතුරින් චීනයෙන්ද සමන්විත විය.1947 අගෝස්තු 14 වන දින පකිස්ථානය ඉන්දියාවෙන් බෙදී වෙනම මුස්ලිම් රාජ්‍යයක් ලෙස නිර්මාණය විය. මෙහිදී තම ජාතිය වූ මුස්ලිම් ජාතිය උදෙසා වෙනම රාජ්‍යයක් පිහිටුවා ගනු ලැබීය. පකිස්ථානයේ පාලනය පිළිබඳව අවධානය යොමුකිරීමේදී ඒ තුළ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය අභියෝග රැසකට ලක්ව ඇත. 1947 වෙනම රාජ්‍යයක් වූ පකිස්ථානය තුළ හමුදා පාලනයක් නැතහොත් ඒකාධිපති පාලනයක් දැකගත හැකි විය. පාකිස්ථානය ලබාගත් නිදහසත් සමඟ එහි සමාජ, ආර්ථික, සංවර්ධනයක් වෙනුවට දිළිඳු බව වර්ධනීය තත්ත්වයකට පත්විය.දිළිඳු බව නිසාම ක්‍රමයෙන් පකිස්ථානය හමුදා නිලධාරී පාලනයට අවතීර්ණ විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 1958 ඔක්තෝබර් 07 වන දින අයූබ් ඛාන් හමුදාපති, පාලකයා බවට පත්විය.නමුත් බලාපොරොත්තු වූ පරිද්දෙන් රටේ තත්ත්වය සංවර්ධනය වනවාට වඩා බිඳවැටීමකට ලක් විය. එමෙන්ම ඉන්දියාව හා පකිස්ථානය අතර බෙදා වෙන් නොකළ කාශ්මීරය වැනි දේශ සීමා නිසා දෙපක්ෂය අතර මතබේද හා ආයුධ සන්නද්ධ ගැටුම් ඇති විය. එමෙන්ම බෙදා වෙන් කරන අවස්ථාව වන විට ඉන්දියානු පෙදෙස්වල මුස්ලිම්වරු සුළු ජාතිය වූ අතර පකිස්ථානු පෙදෙස් වල මුස්ලිම් නොවූවන් සුළු ජාතිය වූහ. සුළු ජාතිය වූ මුස්ලිම් වරුන් හා මහ ජාතිය වූ හින්දූන් මුල්කරගෙන රටවල් බෙදීම නිසාද ඉතා සංකීර්ණ ගැටලු ඇති විය.

තවදුරටත් සාකච්ඡා කිරීමේදී මෙම අර්බුදකාරී තත්ත්වය මත ඉන්දියානුවන් හා පාකිස්ථානුවන් අතර දේපල පිළිබඳ ප්‍රශ්නයක්ද ගොඩනැගුණි. එමෙන්ම පංජාබය නැමැති ප්‍රදේශය පාකිස්ථානයට අයත් වූ අතර එහි ජන සංයුතිය හෝ දේශසීමා පිළිබඳ කිසිඳු හැඟීමකින් තොරව බෙදා වෙන් කරනු ලැබීය. එහි ප්‍රතිඵලය වූයේ ඉන්දු නදියේ ජලය බෙදා ගැනීමේ ගැටලුවක් ඉස්මතු වීමය. පංජාබය දෙකට බෙදීම හේතුවෙන් පංජාබය හා පාකිස්ථානය අතර "ජලය බෙදා ගැනීමේ ගැටලුව දීර්ඝකාලීන එකක් විය. එමෙන්ම ඉන්දියාව හා පාකිස්ථානය වෙන් වීම මත දෙරට අතර උරුම වූ වත්කම් හා වගකීම් බෙදා ගැනීම පිළිබඳ ගැටලු මතුවිය. එමෙන්ම මධ්‍යම රජය යටතේ පැවති හමුදාව හා හමුදා ආයුධ බෙදා ගැනීම මෙන්ම දෙරට අතර වෙළඳ සම්බන්ධතා ඇතිකර ගැනීම පිළිබඳවද මතබේද ගොඩනැගෙන්නට විය.''(ඩබ්.එම්. කරුණාදාස පිටුව 72)
සාමාජීය වශයෙන් ගත් කල සංස්කෘතීන් දෙකකට අයත් මුස්ලිම් වරුන් මෙන්ම හින්දූන්ද සිතුවේ තමන් අනෙකාට වඩා උත්තරීතර යන්නය.මෙලෙස පිහිටීම අවට තිබෙන්නාවූ ස්වභාවික සම්පත්, නායකත්වය මෙන්ම බාහිර සාධක මත පාකිස්ථාන දේශපාලනයට හූ දේශපාලනය බලපෑම් කරන ආකාරය විමර්ශනය පැහැදිලි වන්නකි.

**බංග්ලාදේශය**

දකුණු ආසියානු දේශපාලනයට හා දේශපාලනය සිදුකරන බලපෑම විමසා බැලීමේදී බංග්ලාදේශය පිළිබඳව අවධානය යොමුකළ යුතුවේ.බටහිර පකිස්ථානය හා නැගෙනහිර පකිස්ථානය එනම් බංගලාදේශය අතර සන්නද්ධ අරගලයක් පැන නැග්ගේය. 1971 මාර්තු 26 වැනිදා සිට 1971 දෙසැම්බර් 16 දක්වා කාලය තීරණාත්මක කාලයක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස බංග්ලාදේශය වෙනම රාජ්‍යයක් බවට පත් විය. මෙහිදී බටහිර හා නැගෙනහිර පාකිස්ථානය තුළ ජීවත්වූවන් අතර වූ භාෂාව, ආගම, කලාව සහ ඇඳුම් පැළඳුම් ආදිය එකිනෙකට වෙනස් විය.1948 දී බලයට පත්වූ මෙහොමඩ් අලි ජින්නා ප්‍රකාශ කලේ ''රාජ්‍යය භාෂාව විය යුත්තේ උර්දු පමණි'' යන්නය. එවකට උර්දු භාෂාව භාවිතා කලේ බංග්ලාදේශයේ ජනතාව පමණි. මෙම තත්ත්වය මත 1952 පෙබරවාරි 21 ඇතිවූ ගැටුම්කාරී තත්ත්වයය මත විශාල පිරිසක් මිය ගියහ.(ලංකාදීප දියත 2007.04.22)

පකිස්ථානය හා බංගලාදේශය අතර ගැටුම්කාරී තත්ත්වයක් නිර්මණය වූ අතර එයට බලපාන ලද්දේ භාෂාව, ආගම මෙන්ම සංස්කෘතික විවිධත්වය යැයි පැවසීම ඉතා යෝග්‍යවන්නකි. මෙම තත්ත්වය මත යුධමය වාතාවරණයක්ද දෙරට අතර බිහිවිය චිතගොන් ප්‍රදේශය ආශ්‍රිතව ගොඩනැගුණාවූ තත්ත්වයද මෙහිදී අමතක නොකල යුතු කාරණයකි. අවාමි ලීගයට පක්ෂපාතී වූ මුක්තිබාහිනී (Mukthi Bahini) නම් කණ්ඩායම බංග්ලාදේශය නිදහස් වීමෙන් පසු චිතගොන් කඳුකරයට අවතීර්ණ වන අතර ඔවුන් එහි වාසය කරනු ලැබූ පහඩීස්වරුන්ගේ තත්ත්වය පහල හෙලා ක්‍රියා කරනු ලැබීය. මෙහිදී බංග්ලාදේශ අගමැති මුජිබර් රහමන් පහඩීස්වරුන්ගේ සංස්කෘතිය සම්ප්‍රදායන් ආරක්ෂා කිරීමට කටයුතු කරනු ලැබූවත් බංග්ලාදේශ රජය හා මෙම ගෝත්‍ර අතර සැකය හා අවිශ්වාසය ගොඩනැගින. මෙහිදී ගෝත්‍ර ජනතාවට අධ්‍යාපනය නොලැබීම, සාම්ප්‍රදායික කෘෂිකාර්මික ක්‍රමයන්ට බාධා කිරීම ආදී හේතූන් මත පසු කාලීනව විශාල පුද්ගල ඝාතන සිදුකලේය. මංකොල්ලකෑම්, දූෂණ ආදිය බහුලවූ අතර බංග්ලාදේශ ආණ්ඩුව විසින් පහඩීස්වරුන් ඝාතනය කරනු ලැබීය. දේපල හානි සිදුකිරීම, සන්නිවේදන ක්‍රමයන්ට හානි සිදුකිරීම ආදිය මගින් විශාල පරිහානියක්ද ඇති විය.

**නේපාලය**

නේපාලය දෙසට අවධානය යොමුකිරීමේදී නේපාල රාජ්‍යය මුහුදක් නොමැති හිමාල කඳුවැටියෙන් වටවූ රාජ්‍යයකි. උතුරින් චීනයෙන්ද දකුණින්, නැගෙනහිරින් හා බටහිරින් ඉන්දියාවෙන් වටවී ඇත. ''1923 දී බ්‍රිතාන්‍ය හා නේපාලය මිත්‍ර ගිවිසුමක් අත්සන් කළ අතර මෙහිදී නේපාලයේ නිදහස බ්‍රිතාන්‍ය විසින් පිළිගන්නා ලදී. 1950 දී නේපාලය ඉන්දියාව විසින් ස්ථිර කර ගත්තේය''(රංග ප්‍රභාත් කුමාරසිංහ, පිටුව 51).

නේපාලයට රාජපරම්පරාවක් හඳුන්වා දුන්නද ඇතිවූ මහජන උද්ඝෝෂණ මගින් රජතුමාගේ පාලනය පාර්ලිමේන්තුවට බාරවිය. නමුත් නේපාලයේ පැවති ළිඳු බව සීඝ්‍රයෙන් ඉහළ ගිය අතර සාමාන්‍ය ජනතාව එක රොටියක් පමණක් කෑමට පුරුදු විය. කත්මණ්ඩු ප්‍රධාන නගරයේ වැඩි කොටසකට පහසුකම් ලැබී ඇතත්, මෙහි ජීවත්වන 85% දුප්පතුන්ය. දරිද්‍රතාවය හේතුකොටගෙන අධ්‍යාපනය නොලැබීම, සෞඛ්‍ය පිරිහීම මෙන්ම රටේ සංවර්ධනයද ආර්ථිකයද සීඝ්‍ර ලෙස පහත වැටීමකට ලක්ව ඇත.

මෙයට බලාපාන ලද ප්‍රධානතම හේතු වූයේ පවතින නායකත්වයේ දුර්වලතාවයත්, දේශපාලන අස්ථාවරත්වයයි.මෙහි භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 147,200 ක් පමණ වන අතර නේපාලය වටා ඇත්තේ කඳුකරය හා ගංගාය. මෙම පලාතේ සියල්ලම සාරවත් භූමි ලෙස පිලිගෙන ඇති නමුත් මෙම පලාත් දියුණු කිරීමට උත්සහ නොගන්නා අතර එම තත්ත්වය නේපාලයේ පවතින තත්ත්වයට බලපා ඇත.

**මාලදිවයින**

දකුණු ආසියානු කලාපයේ කුඩාම රාජ්‍ය හෙවත් මාලදිවයින යනු කුඩා දූපත් 1192 කින් යුක්තවූ දූපත් රාජ්‍යයකි. 1956 ජූලි 26 දින මාලදිවයින බ්‍රිතාන්‍ය සමග ගිවිසුමක් ඇතිකරගත් අතර එමගින් මාල දිවයිනට නිදහස ලැබුණි. 1968 මාලදිවයන සමූහාණ්ඩුවක් බවට පත්විය. එමෙන්ම මෙය බ්‍රිතාන්‍යයේ ආරක්ෂක රාජ්‍යයක් වශයෙන්ද තබා ගන්නා ලදී. මාලදිවයනේ භූ දේශපාලනය වෙත අවධානය යොමු කිරීමේදී රටතුළ ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් මෙන්ම මුස්ලිම්කරණය පිළිබඳ යම් අදහස් ප්‍රමාණයක් ඉස්මතු වූවත් මාලදිවයින් ජනාධිපතිවරයාට සිය ධූරයෙන් ඉවත් වීමට සිදු වූයේ ඉන්දියාව හා චීනය අතර සිදුවන බලදේශපාලනයේ ප්‍රතිඵලයක් ලෙසය. හිටපු මාලදිවයින් ජනාධිපතිවරයා ඉන්දියානු රාජ්‍යය සමග මිත්‍ර සබඳතා පැවැත්වීමට වඩා අනෙකුත් රාජ්‍යන් සමඟ වැඩි මිත්‍ර සබඳතා පැවැත්වීය.මෙම තත්ත්වය මාලදිවයිනේ වර්තමාන තත්ත්වයට බෙහෙවින් බලපෑම් කලේය.

**ශ්‍රී ලංකාව**

ශ්‍රී ලංකාව දෙස අවධානය යොමු කිරීමේදී එය ඉන්දියන් සාගරයේ ඉන්දියාවට දකුණු දෙසින් කිලෝමීටර 31 ඈතින් පිහිටා ඇත. ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී රාජ්‍යයක් වූ ලංකාව 1948 පෙබරවාරි 04 වන දින බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලබාගත් අතර ලංකාවේ පිහිටීම මත එහි දේශපාලනයට භූ දේශපාලනය පිළිබඳව අවධානය යොමුකළ යුතුවේ.භූ දේශපාලන සංකල්පය තුළ ශ්‍රී ලංකාව කුඩා රාජ්‍යයකි.කුඩා රාජ්‍යයක් වූ ශ්‍රී ලංකාවට තමන් අයත්වන බලපෑම් කෙන්ද්‍රයේ ප්‍රධාන රාජ්‍යයේ භූ දේශපාලනයට අවනත වීමට සිදුවේ. එනම් ඉන්දියානු රාජ්‍යයේ භූ දේශපාලනයට අවනත වීමට සිදුවේ. මෙහිදී ශ්‍රී ලංකාවට ස්වාධීන වූ ජාත්‍යන්තර සබඳතාවයක් පවත්වාගෙන යාමට නොහැකිවේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ බහුතරය වන සිංහල ජනතාවට සංස්කෘතික වශයෙන් නෑකම් කියන වෙනත් ජන වර්ගයක් නොවීම නිසා ශ්‍රී ලංකාවේ භූ දේශපාලනය සංස්කෘතික වශයෙන් හුදෙකලා වී ඇත.

මෙහිදී ශ්‍රී ලංකාව දුප්පත් රටක් වීමමත අධික ලෙස විදේශීය රටවල් සහ ජාත්‍යන්තර ආධාර ආයතනවල ණය සහ ආයෝජන මත යැපීමට සිදු වීම මත ලංකාවේ විදේශ සබඳතා පමණක් නොව ජාත්‍යන්තර වෙළදාම හා දේශීය ආර්ථිකය, දේශපාලන ප්‍රතිපත්ති පවා මෙරට ණය සහ ආධාර සපයන රටවල මෙන්ම ආයතන වල කැමැත්ත මත තීරණය කිරීමට සිදුව ඇත. එබැවින් මෙහිදී දරිද්‍රතාවය භූ දේශපාලන සාධකයක් ලෙස බලවත් වී ඇති ආකාරය මනාව පෙන්නුම් කරයි. L.T.T.E විසින් ඊලාම් රාජ්‍යයක් ගොඩනගා ගැනීමට භූමිය බෙදා වෙන් කිරීමට අරගල දියත් කිරීම මත සිදු වුනා වූ විශාල මිනිස් ඝාතන සංහාරයත්, දේපල විනාශයෙත්, ආර්ථික බිඳවැටීමත් සහ සංවර්ධන පසුගාමීත්වයත් මෙහිදී පෙන්වා දිය හැකි තවත් එක් සාධකයකි.

මේ ආකාරයට දකුණු ආසියානු දේශපාලනයට භූ දේශපාලනය සිදු කරනු ලබන බලපෑම සුළුපටු නොවේ. තවත් අවධානය යොමු කළ යුතු රාජ්‍යයක් ලෙස භූතානය සහ ඇෆ්ගනිස්ථානය හඳුනා ගත හැකිය. මෙහිදී දකුණු ආසියාවේ පිහිටි භූමියෙන් පමණක් කොටුවුණු තවත් රටක් ලෙස භූතානය හදුන්වාදිය හැකි අතර එය ඉන්දියාව හා මහජන චීන සමූහාණ්ඩුව යන රටවල් දෙක අතර පිහිටා ඇත. 1910 දී භූතානය බ්‍රිතාන්‍ය සමඟ විදේශ කටයුතු වලට මග පෙන්වීමේ ගිවිසුමක් අත්සන් කළේය. ඒ සමගම බ්‍රිතාන්‍ය රජය විසින් එම රාජාණ්ඩුව පිළිගන්නා ලදී.

ඉන්දියාව හා භූතානය අතර සබඳතාව 1950 ගණන් සිට පැවත එන්නකි. භූතානය චීන දේශසීමාවේ පිහිටා තිබීම මත භූතානයට චීනයෙන් එල්ලවිය හැකි තර්ජන හේතුවෙන් ඉන්දියාව සමඟ එක්ව සිය ආරක්ෂාව තහවුරු කරගනු ලැබීය. එමෙන්ම හිමාල ප්‍රදේශයේ යුද්ධෝපායමය වශයෙන් වැදගත්වීම මත ඉන්දියාව භූතානයට සිය ආරක්ෂාව සැපයීය. එම පදනමින් 1949 දී ගිවිසුමක් ද අත්සන් තැබීය. වෙළඳ, වාණිජ හා ආර්ථික වටිනාකමින් යුත් සම්පත් පිහිටීමද භූතානය සුවිශේෂීභාවයක් ඉසිලීය.

මෙසේ දකුණු ආසියානු රාජ්‍යයන් හි දේශපාලනයට, භූ දේශපාලනය කුමන ආකාරයෙන් බලපෑම් සිදු කරන්නේ ද යන්න ඉහත කාරණා හමුවේ මැනවින් විමර්ෂණය කෙරේ. සැබැවින්ම රාජ්‍යයක දේශපාලනයට සිය රාජ්‍ය අවට පිහිටි රාජ්‍යයන්හි පිහිටීම, එහි ස්වභාවය, දේශසීමා, ආර්ථික ශක්තීන්, නායකත්වය, සංස්කෘතිය මෙන්ම රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් ද වශයෙන් යන භූ දේශපාලන සාධක සියල්ල බලපෑම් කරන බව ඉහත සාධක හමුවේ අවසාන වශයෙන් නිගමනය කල හැක.

**ආශ්‍රිත ග්‍රන්ථ**

කරුණාදාස, ඩබ්ලිව්.එම්.ජාත්‍යාන්තර අර්බුද, ඉමේජ් ලංකා ප්‍රකාශන, දෙහිවල.

කරුණාදාස, ඩබ්ලිව්.එම්. දකුණු ආසියානු දේශපාලනය, ඉමේජ් ලංකා ප්‍රකාශන, දෙහිවල.

කුමාරසිංහ රංග ප්‍රභාත්, වර්තමාන ලෝක සම්බන්ධතා, එස්.ගොඩගේ සහ සහෝදරයෝ

ජගත්චන්ද්‍ර, සී.ඒ.(2001) ජාත්‍යාන්තර දේශපාලන ප්‍රවනතා, කතෘ ප්‍රකාශන

ජයමහ විජේතිලක, ඉන්දියාව සහ පකිස්ථානය, ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්.

දික්වැල්ල රංජිත්, ප්‍රියන්ත රේණුක, හෙට්ටිආරච්චි ශිරානි, ගැටුම් නිරාකරණය න්‍යාය සහ භාවිතය, ආරිය ප්‍රකාශකයෝ.

සකලසූරිය, නිශාන්ත.පී, ලෝක බලය සහ එහි භූ දේශපාලන පදනම, භෞම විද්‍යා 4 වන කලාපය, භූගෝල විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය.

http://www.chinadaily.com.ch/china

http://prb.org/countries/India.aspx